

# කොරටුවෙගෙදර අප්පුහාමිගෙ හෑල්ල

**එදා** ආනන්ද ගෙදර ගියාට පස්සේ මං ටිකක් කල්පනා කලා මං ආනන්දලෑ ගෙදර ගිහිං කොතනින්ද කතාව පටං ගන්නෙ, මොනවාද කියන්නෙ කියලා. පෙලක් වෙලාවට කල හොඳ පස්සෙං එන්නත් පුලුවං නේ. ඉස්තෝප්පුවෙ තියන මගේ සය්ලාසනේ දිගෑදුනාම ඔය් වගේ දේවල් ගැන හිතන්න ලේසිය් වගේ. මං පුටුවෙං නැගිට්ටා, වැඩිය පරක්කු වෙලා යන එකත් හොඳ නෑ කියලා හිතුනු හින්දා උදේ සිරියාවතී හාමිනෙ කරපු කතාව කිසිම බරක් පතලක් ඇතුව කරපු එකක් නෙවි. ඒත් ඒ කතාව මගේ හිතේ කැකෑරි කැකෑරි තිව්නා.

''හේනං සිරියාවතී හාමිනේ මං අර කියාපු ගෑනු ලමයාත් කැන්ද ගෙනම එන්නංකො. ඔහේ ඉතිං සුදු මල් වට්ටියක් සූජානං කල්ලා තියන්නකො''

''ඇය් සුදු මල් වට්ටියක්? අලුප්ජෝඩුව ආපු ගමං පන්සල් යන්නද?

''නෑ නෑ වදේ නෑ. සිරියාවතී හාමිනේට ඒකවත් තේරෙන්නෑ. ඇය් දෙය්යනේ නාකි උනත් මනමාලියෙක් නේ. හා හාපුරා කියලා මේ ගෙදරට එන්නෙ අද නේෟ ඔහේ සුදු මල් වට්ටියත් අරං පෙර මඟට ඇවිල්ලා අපි දෙන්නා පිලිගන්න එපායැෟ ඒ මනුස්සයාගෙ අතිං අල්ල ගෙන ගෙදරට කැන්ද ගෙන එන එක ඔහේගෙ යුතුකම නේ ෟ සිරියාවතී හාමිනේ යටතොල විකාගෙන හිනාව තද කරගෙන සිටින හැටි මගේ හොර ඇහැට පෙනුනි. මට මිදුලට බැස මීටර දහයක්වත් ඉදිරියට යන්නට ලැබුනේ නැත.

''හෝව් හෝව්, පොඩ්ඩක් හෝව්. මේං මනමාල මහත්තයාගෙ බස්තම් පොල්ල. මේක ගෙදර තියලා ගිහිං බෑනේ. කඩිසර ගමනිං එතනට පැමිනි ඈ පිරිකරක් පූජා කරන විදියට දෝතිම්ම බස්තම මට පිලිගැන්නුවාය. ''හොන්ද අ.. අ.... ලමයා''

''දෙය්යන්නෙ පිහිටයිෟ තට්ටෙ පලෝ ගන්නැතුව පරෙස්සමෙං ගෙදර එන්න.

''හරි හරි .... මං කොහොම හරි ඔලුව බේරගෙන ගෙදර එඤද්ඤදංකො'' සිරියාවතී හැමිනෙත් ඇඟට පතට නොදනි බය්ස්කෝප් කෑලි දාන හැටිෟ මොකෝ ඉතිං හුරුතල් බලන්න පොඩි එකෙක් ඉන්නවය්. ඔලුව අත ගාන්න උනත් ටොකු අනින්න උනත් ඉන්නෙ මං විතරය් නේ,

ආනන්දලෑ ගෙදර ගාවටම ගියා. කොහොම යැව්නාද කියාවත් මට කල්පනාවක් නෑ. මගේ ඔලුව සිරියාවතී හාමිනේ ලඟ තියලා ආවා වගේ. මං මිදුලට යනකොටම ආනන්ද දොරකොඩ ලඟට ආවා ෟ ''මම්මේ මඟ බල බල හිටියා මාමා එනකං''. ''මං පරක්කු උනාද?'' ''නෑ නෑ මගෙ තදියම නේ ෟ ''

අපි ගේ ඇතුලට යන විටම ඈද, ආනන්දගේ නැන්දම්මාද කුස්සිය පැත්තේ සිට සාලයට ආවාය. ''අද ගෙදර අමුත්තෙකුත් ඉන්නෞ'' ''ඔව් අප්පුහාමි මාමා. ඒ අපේ මාලිනීලෑ අම්මා. මාලිනීට උදව්වට ඇවිත්. දැං සුමාන දෙකක් විතර ඇති.'' ''අහා, ඒක හොඳය්. තාත්තලාට බැරි වැඩ හුඟක් කරන්නෙ අම්මලා නේ නේද?'' ඇයගේ කට දෙකොන දෙකන තෙක්ම දික් උනා සේ පෙනුනි.

අපි සාලයේ සැටියේ ඉඳ ගතිමු. ආ ගිය පුවත් කතා කෙලෙමු. විනාඩි තුනක්වත් ගත වූයේ නැත. තේ කෝප්ප දෙකක් බන්දේසියක තබා ගත් ඈ එතැනට පැමිනියාය. ''ලිපේ වතුර උනු වෙවී තිව්නා. ඒක හින්දා ඉක්මනටම මං තේ හැදුවා. ''හෝටලවලත් ඒ වගේ'' වැනි විහිලුවක් කිරීමෙන් ඇගේ සිත තැලෙන්නට පුලුවන් සේ සිතුනු නිසා ''ංආ.... මගේ ගානටම කහටත් තියෙන්නෙ'' ය් කියූ මම ඈ මුරුං අත්තේ තැබීමි. යලිත් ඇගේ කට දෙකොන දෙකන තෙක් දික් වන සැටි මගේ හොර ඇහැට පෙනුනි. එහෙත් තව ටික වෙලාවකිං ඇගේ කට උල් වන සැටිත් මූන දික් වන සැටිත් මට පෙනෙන්නාක් මෙන් විය.

ඉතිං ආනන්ද මහත්තයා, අපට උදේ කතා කරන්න උනේ නෑනේ ෟ පොඩි ගමනක් ගිහිං එන්නං කියලා මං කිව්වෙ අමූලික බොරුවක්. ඇත්ත කතාව කියන්න බැරි හින්දය් මං කීවේ මං ගමනක් ගිහිං එන ගමං ආනන්ද මහත්තයලෑ දිහෑ එන්නං කියලා'' ආනන්දගේ නැන්දම්මා බන්දේසිය මේසය මත තබා පුවත්පතක් අතට ගත්තාය. මේසයට වාඩි වූ ඇය පුවත්පතින් මුහුන මුවා කරගෙන එය කියවන සේ අල්ලා ගෙන සිටියාය. ආනන්ද එක් ඇසක් වසා මට ඉඟි කෙලේය.

මම යලි කතාව පටන් ගතිමි. අපේ ගෙදර මේ වගේ නිස්කලංකෙ ඉඳගෙන තමන්නෙ කතාවක් කරන්න පුලුවං තැනක් නෙවි. අපේ සිරියාවතී හාමිනේ ඉන්නවා නේද, කියලා වැඩක් නෑ. ලස්සෙකිං හොයා ගන්න බැරි රත්තරං කඳක්. මට තේ එක ගෙනත් දෙන්නෙත් දෑතිං. මං වැඩක් කර කර හිටියොත් ඒක කොහෙං හරි තියලා යන්නෑ, අල්ල ගෙනම ඉන්නවා. අපි ඉතිං ඉංගිරිසි පන්නෙට ''තැංකුය්'' හරි 'ඉස්තූතිය්' හරි කියන පුරුද්දක් නෑනේ ෟ මූන බලලා ටිකක් විරිත්තුවාම ඒ ඇති. කව්රුවත් ලඟ පාතක නැත්තං ''අපොය් මනමාල හිනාව'' බලාපල්ලකො මූනෙ හැටි විතරක්, කුස රජ්ජුරුවෝ වගේ'' වගේ ජෝක් පාරක් දාගෙනය් ඈ ආපහු යන්නෙ. ආනන්ද පුතාට කියන්නෙ, මං ගෙදර නැත්තං ඔය ගෑනි කවදාවත් කන්නෑ. මං එනකං හූල්ල හූල්ල ඉන්නවා. කොය් වෙලාවක හරි මං ගෙදර ඇවිත් බත් බෙදා ගත්තට පස්සෙය් උන්දැත් බත් බෙදා ගෙන පිඟාන අතට ගන්නෙ. මං දුර ගමනක් ගිහිං නං බොහෝ දවස්වල කහට එකක් වක්කර ගෙන බීලා වේල පියමං කරනවාලු.

හැබැය් එක ම එක වැරැද්දක් තියනවා. මොකක්ද දන්නවාද? මට කව්රුවත් එක්ක නිදහසේ කතා කරන්න නං බෑ. උන්දැත් එනවා සබේට. ඇවිත් අහගෙන ඉන්නවා, විතරක් නං ඒත් කමක් නෑ කියමුකො. හරස් ප්‍රස්නත් අහනවා. ඒක එහෙම නොවෙය්, මෙහෙමය් කියනවා. අපට අපේ කතාව නවත්තලා එයා කියන දේට ඇහුංකං දෙන්න වෙනවා. ඊලඟට අපට මතක නෑ අපි කතාව නවත්තපු තැනවත්. මං මුලදී මුලදී උපහැරන වලිං කිව්වා. අපේ ගුරුන්නාන්සේ මහත්තයාගෙ හාමිනේගෙ හොඳ කිව්වා, ''ඉස්කෝලෙ හාමිනේ කිසිම දවසක අපි කතා කර කර ඉන්න තැනට එන්නෑ. හොරෙංවත් අහං ඉන්නෑ'' කියලා. කෝ ඉතිං උන්දැට ඒ හරුප තේරෙන එකක්යැෟ උන්දෑගෙ හිත රිද්දන්නෙ නැතුව වැඩේ කරන්නය් මං ආනන්ද මහත්තයාට ඒ බොරුව කීවෙ.

කෝ, නමස්කාරෙටම තෙල් පාන ඉවර වෙන්නය් යන්නෙ. තාම බැරි උනා නේ ආනන්ද මහත්තයා අද අපේ දිහාවෙ ආපු කාරනාව මොකක්ද කියලාවත් අහන්න.'' ආනන්ද හූමිටි තිව්වා මිසක් වචනයක්වත් කතා කෙලේ නෑ. ආනන්දගෙ නැන්දම්මා බලමින් සිටි පුවත්පත බිම වැටෙන හඬ ඇසී අපි ඒ දෙස බැලීමු. ඇය මේසය මත ඉහ තබාගෙන තද නින්දේය.

''අම්මා'' හැමදාම නිදා ගන්න කොට රෑ දහය එකොලහ වෙනවා. කොච්චර පහු වෙලා නිදා ගත්තත් අම්මා දවල්ට නිදා ගන්නෑ. හැබැය් වාඩි වෙලා ඉන්න කොටත් නිදා වැටෙනවා. යලිත් වරක් එක් ඇසක් වසා මට ඉඟි කල ආනන්ද ඈ වෙත ගියේය. 'අම්මාහ්, අම්මාහ්'' ඈ තද නින්දේය. හොඳටම නින්ද ගිහිං වගේ, අම්මාහ් කාමරේට ගිහිං ටිකක් නිදා ගන්න.'' එවිටම වගේ මාලිනී පැමිනියාය. ''ආ අප්පුහාමි මාමා, ආනන්ද උදේ කීවා අප්පුහාමි මාමා අද මේ පැත්තෙ එනවය් කියලා. මං ගියා මහන්න දීපු ඇඳුං වගයක් ගේන්න, මේ කිට්ටුව තැනකට.''

''ඔයා මොකෝ පරක්කු? මේං අම්මාට මෙතන නින්ද ගිහිං. කාමරේට එක්ක ගිහිං නිදා ගන්න කියන්න. ඇය අම්මාගේ උරයට අත තබා ''අම්මා, නැඟිටලා යං කාමරේට'' ඇය තිගැස්සී අවදි උනාය. ''අම්මා ටිකක් නිදා ගන්න යං'' ඇස් පොඩි කරමින් වටපිට බැලූ ඈ ඒ මේ අත පැද්දෙමින් කාමරයට ගියා ය.

''මාමාගෙ බේත හොඳට වැඩ කලා වගේ.'' ආනන්ද මට ලං වී තොල් මැතුරුවේය. මගේ කටත් නලියන්නට විය. ''ඉතිං ආනන්ද මහත්තයා එදා අර බේතෙං ලෙඩාට සනීප උනාද?'' ''මොනවා කියනවාද මාමා, ඒ බේත නං මහවිසද පන්ඩිතයාගෙ හඳුං ගැටේ පරාදය්. ලෙඩේ පිහදලා දැම්මා වගේ.'' ආනන්ද කීවේ හිනාව කාගෙනයි. ''හරි ග්‍රීස්මය්. අපි අඹ ගහ යටට යමු නේද? අපි ඉස්තෝප්පුවේ තිබුනු පුටු දෙකකුත් උස්ස ගෙන අඹ ගහ යටට ගියෙමු. අප දෙදෙනා ම සිනාව තද කරගෙන සිටියේ බොහෝ ම අමාරුවෙනි.

'දුස්කර අවස්තාවක් ඇති උනාම නිදා වැටෙන එක හරි, හොර ලෙඩ ගන්න එක හරි සමහරුංගෙ සිරිත. ඇගේ රඟපෑම අපට තේරුනේ නෑ කියලා ඈ හිතාගෙන ඉන්නෙ. ඒ රඟපෑම නොකලානං, අපේ කතාව ඈටත් ඇහුනාය කියලා අපි හිතනවා නං ඈට මේ ගෙදර තවදුරටත් ඉන්න බෑ. ඒක හින්දා අපේ කතාව තමන්ට ඇහුනෙ නැති බව එයා අපට පෙන්නුවා. දැං දෙපැත්තම ගැලය්. ඒ අසනීපෙ ආය් හැදෙන එකක් නෑ. එහෙනං ආනන්ද මහත්තයා අපි ගිහිං එන්නං.''

''අප්පුහාමි මාමා නං දෙය්යෙක් වගේ. අතක් පයක් කැඩෙන්න නොදී මං බේර ගත්තා.''

■





STANHOPE PRINTING

FOR OFFSET AND DIGITAL PRINTING

සිඩ්නි සහ මෙල්බර්න් ශ්‍රී ලාංකිකයනට කදිම අවස්ථාවක්

- Labels
- School Magazines
- News Letters
- Business Stationery
- Annual Reports
- Special Publications
- Posteres
- Brochures
- Greeting Cards
- Business Cards
- Flyers
- Price Lists

ALL YOUR PRINTING NEEDS....

ඔබගේ සියලුම මුද්‍රණ කටයුතු සඳහා පහත සඳහන් අංකයනට අමතන්න

මුද්‍රණ ඇනවුම් සඳහා තැපැල් ගාස්තුවලට අයකිරීමක් නොමැත

LAKSHMAN

TEL.(02) 9626 7660

MOB.0405287243